

ගම්භායිනේගෙ අගේ
නෙතුම්සා මිනදි හේරත්

කෘතියේ නම | ගම හාමිනේගෙ අගේ

කතෘගේ නම | නෙතුම්සා මිනදි හේරත්

කතෘගේ වෙනත් කෘති | පුංචි මගේ කතන්දර

කෘතිය පළ කරන දිනය | 2025-02-08

ප්‍රථම මුද්‍රණය | 2025

ලිපිනය | අංක : 502, උඩගම, අම්පිටිය

ISBN අංකය | 1 5 3 7 7 8 3

මුද්‍රණය | චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර.

# පිදුම

**විදුහල්පතිනිය, පන්තිභාර ගුරුතුමිය ඇතුළු ගුරු මෑණිවරුන්ට පුදමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකෝමත් එක රට ගමරාල කෙනෙකුයි, ගමහාමිනේ කෙනෙයි ජීවත් වුණා. ගමරාලටයි, ගමහාමිනේටයි පුතෙකුයි, දුවෙකුයි හිටියා.



ගමරාලට ලොකු හේනක් තිබුණා. ගමරාලයි, ගමහාමිනෙයි හැමදාම හේනට යනවා.



එක දවසක් ගමහාමිනේගේ අම්මට
අසනිපවෙලා ගමහාමිනේට
අම්මලාගේ ගෙදර යන්න වුණා.

"ඔහේට පුළුවන්ද දුවයි, පුතයි
බලාගන්න ?" ගමහාමිනේ ඇහුවා.

"අපොයි පුළුවන්, ඒක සුළු
දෙයක්නේ." ගමරාල කිවුවා.



ගමහාමිනේ පිටත් වුණා.
ඒ දවසේ රෑ ගෙවිලා එළි වුණා.




ඉරත් පායලා, පුතයි, දුවයි
ඉස්කෝලේ යවන්නත් ඕනේ.
ගමරාල හිතුවා"

දුවේ, පුතේ නැගිටින්න. ඉස්කෝලෙ
යන්න ලෑස්ති වෙන්න. පරක්කු වෙලා
තියෙන්නේ. ගමරාල කිවුවා.



ගමරාල උයාගන්නෙත් බොහොම අමාරුවෙන් බතේ ඇටත් අමුයි. ව්‍යංජනත් මෙලෝ රහක් නෑ.



හාමිනෙත් හිටියනම් කොච්චර හොඳද ගමරාල හිතුවා.



ඉර පායවුවා. ඊළඟ දිනය උදා වුණා. ගමහාමිනේ ගෙදර ආවා.




ගමහාමිනේට ගමරාල ඔක්කොම දුක් ගැනවිල්ල කිවුවා.



ගමහාමිනේටත් හිනා.
"ඒකනේ, මම නැති අඩුව දවසින් දැනුන නේද ?" ගමහාමිනේ ඇහුවා.

තුන්දෙනාම එකවර "ඔව්.. ඔව්" කිවුවා.

"හිසේ තිබ්බ ලොකු බරක් බිමින් තිබ්බා වගේ දැනුනා." ගමරාල කිවුවා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්